# "තිලගුල්ල වාපිය" පිළිබඳව වාරිපුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

පී.ආර්. අසංක බුද්ධිකසිරි, සුරංග පුෂ්පකුමාර, එච්.පී.කෝකිලා දුලංජි සමරසිංහ,
ඒ.කේ. රංගිකා මධුමාලි, ආර්.පී.වසන්තා සුධර්මා කුමාරි

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

---

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තලගල්ල නම් ගමෙහි "තිලගුල්ල වාපී" හෙවත් තලගල්ල වැව පිහිටා තිබේ. වර්තමානයේ නෂ්ටාවශේෂ කිහිපයකට පමණක් සීමා වන මෙම වැව අනුරාධපුර යුගයේ සිට පැවත එන බවට ජනප්‍රවාද වේ. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ පුරාණ තලගල්ල වැව පිළිබඳව මූලික පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකිරීම ය. එම අරමුණ සාධනය සඳහා මෙම වැව සම්බන්ධ තොරතුරු ඇතුළත් ලිඛිත මූලාශ්‍ර පරිශීලනය කළ අතර ඉන් අනතුරුව ක්ෂේත්‍ර අධ්‍යයනයන්හි නියැලිණි. මෙම පර්යේෂණයේදී මුහුණපෑමට සිදුවූ මූලික ගැටලු වූයේ අදාළ වැව වර්තමානයේ භාවිත නොවීම සහ සම්පූර්ණ වශයෙන් දක්නට නොලැබීම ය.

මෙය දැදුරු ඔයේ අතුශාඛාවක් ලෙස ගලා එන තලගල්ල දොළ මූලික කරගෙන ස්වභාවික පරිසරයේ පිහිටීම අනුව නිර්මාණය කරනු ලැබූ වැවකි. ජනවිශ්වාස අනුව මහසෙන් රජ සමයේ මෙම වැව නිර්මාණය කළ බවටත්, තලගල්ල සිටාණන් විසින් මෙම වැව නිර්මාණය කළ බවටත්, මහා පරාක්‍රමබාහු රජු විසින් ජනතා සේවයක් ලෙස මෙම නිර්මාණය සිදු කළ බවටත් ජනප්‍රවාද පවතියි. යාපහුවට නුදුරින් පිහිටා ඇති හෙයින් දීර්ඝ කාලයක් පුරා තලගල්ල වැව එම කලාපයේ ආර්ථිකය සම්බන්ධ කේන්ද්‍රස්ථානයක් ලෙස පැවත තිබේ. විශාල වපසරියක විහිදී ඇති මෙම වැව පරිහාණියට පත්වීම කෙරෙහි ස්වභාවික හේතූන් මෙන් ම ප්‍රතිසංස්කරණවලට යොමු නොවීම, සොළී ආක්‍රමණිකයන් විසින් මෙම වාරි පද්ධතිය විනාශ කිරීම සහ බ්‍රිතාන්‍ය ආක්‍රමණවලදී අවධානයට පාත්‍ර නොවීම ආදී කරුණු හේතු වන්නට ඇත. මේ ආකාරයට විවිධ වෙනස්වීම්වලට භාජනය වූ මෙම වැවේ භෞතික නිර්මාණාත්මක ලක්ෂණ ගැන අවධානය යොමු කිරීමේදී ස්වභාවික පිහිටි ගල භාවිත කරමින් වැව් බැම්මත්, සොරොව්වත් දේශීය තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා නිර්මාණය කර තිබේ. වර්තමානයේ වැව මධ්‍යයේ වෙහෙරගොඩැල්ල පුරාණ විහාරයේ දක්නට ලැබේ. වැව ආශ්‍රිතව විවිධ ඇදහිලි විශ්වාස පවතින බව ද පර්යේෂණයේ දී අනාවරණය විය.

ඓතිහාසික තොරතුරු අනුව අනුරාධපුර සහ පොළොන්නරු යුගවලදීත් මෙම ගම හා වැව හුදකලා නොවූ බවට සාධක වේ. යාපහුව රාජධානිය ආසන්නයේ පිහිටි මෙම වැව එකල කෘෂි කර්මාන්තයට බෙහෙවින් දායක වූ බව වැවේ ව්‍යාප්ති වපසරිය අනුව නිගමනය කළ හැකිය. වර්තමානයේ මෙම වැව් භූමිය පිහිටි ප්‍රදේශය ප්‍රතිසංස්කරණයක් නොකිරීමට හේතූන් ලෙස මෙම ප්‍රදේශය ආශ්‍රිතව ගම්වැසියන් කුඩා වැව් නිර්මාණය කරගැනීම, වැව් භූමියේ සරු බව නිසා ගොඩ ගොවිතැන් කෙරෙහි වැසියන් යොමු වීම සහ ජනගහණය වැඩි වීම හේතුවෙන් ගම්වැසියන් මෙහි පදිංචි වීම ආදිය දැක්විය හැකි ය.

ප්‍රමුඛ පද : වැව, තලගල්ල, ජනවිශ්වාස